සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තයේ නූතන ස්වභාවය හා එහි අනාගත අභියෝග

යූ.ඩී.ආර්. ෂෙහාන් තිලකරත්න[1], එච්.ඩබ්.එම්.කේ.ඩී කුලතුංග[2]

පේරාදෙණි විශ්වවිද්‍යාලය
[1]rshehan94@yahoo.com,[2]menukakulathunga455@gmail.com

ප්‍රමුඛ පදඃ ලාක්ෂා, නියපොතු වැඩ, හපුවිද, පට්ටල් වැඩ, වර්ණ

හැඳින්වීම

ලාංකේය ඉතිහාසයේ පැරණි ශිල්ප කලාවන් පිළිබඳව කරුණු අධ්‍යයනය කිරීමේ දී දෙවනපෑතිස් රජ දවස සිදු වූ දුමින්දාගමනයත් සමග පැමිණියේ යැයි සඳහන් දහ අට කුලයක ශිල්පීන් පිළිබඳ විස්තරය ඓතිහාසික කඩයිමක් සනිටුහන් කරන්නකි. එතැන් සිට මෙරට සාම්ප්‍රදායික ශිල්ප කර්මාන්තයන්හි ආරම්භය සිදුවූ බවට පිළිගැනේ. ඒ අනුව ඇත් දත්, බෙර, පිත්තල යකඩ ආදී නොයෙකුත් ප්‍රාථමික ශිල්ප කලාවන් ලංකාව තුළ ව්‍යාප්ත වූ අතර එයින් සමහරක් අද දක්වා ම පැවත ගෙන එයි. එවැනි ප්‍රාථමික ශිල්ප කර්මාන්තයක් ලෙසට ලාක්ෂා කර්මාන්තය හැඳින්විය හැකිය. දේශීය ශිල්ප කලාවන්ගේ අනන්‍යතාව ප්‍රකට කරන වැදගත් සාම්ප්‍රදායික ශිල්ප කර්මාන්තයක් වන එය නූතන යුගය වන විට අභියෝග රාශියකට මුහුණ දෙමින් සිටියි.එම කර්මාන්තය සාම්ප්‍රදායික තාක්ෂණයෙන් මිදී නවීන ක්‍රම භාවිතයට යොමු වී තිබේ. එබැවින් සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තයේ වර්තමාන ස්වරූපය සහ අනාගත පැවැත්ම කෙරෙහි එල්ල වී ඇති අභියෝගයන් පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ දී මූලික වශයෙන් අපේක්ෂා කෙරේ.

ක්‍රමවේදය

දේශීය කලාකරුවගේ කලාත්මක හැකියාවන් ප්‍රකට කෙරෙන ලාක්ෂා කර්මාන්තය නූතන යුගය වන විට ලංකාවේ ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වී තිබේ. එම ප්‍රදේශ අතුරින් මාතලේ හපුවිද ග්‍රාමය වැදගත් වේ. අද වන විටත් ලාක්ෂා කර්මාන්තය "නියපොතු වැඩ" නමැති තාක්ෂණික ක්‍රමවේදය භාවිතයෙන් සිදුකර ගෙන යන්නේ එම ප්‍රදේශයේ ය. ඒ අනුව මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේ හපුවිද ග්‍රාමයේ මේ වන විටත් ලාක්ෂා කර්මාන්තයේ නිරතව සිටින ශිල්පීන් තිදෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වමින් මෙම අධ්‍යයනය සිදු කෙරිණ. එහි දී ප්‍රායෝගික වශයෙන් මෙම ශිල්පීන්ගේ වර්තමාන තත්ත්වය, ඔවුන් මුහුණ දෙන අභියෝග සහ මෙම කර්මාන්තයේ අනාගත පැවැත්ම පිළිබඳව තොරතුරු රැස්කර ගැනීමට හැකි විය.

ප්‍රතිඵල

මෙම අධ්‍යයනයේ දී නූතන යුගය වන විට මෙම කර්මාන්තය දැඩි ලෙස සාම්ප්‍රායිකත්වයෙන් ඈත් වී තිබෙන ආකාරයක් හඳුනාගත හැකිවිය. ලාක්ෂා සපයා ගැනීමේ දී ඔවුන් අද වන විට සාම්ප්‍රදායික ක්‍රමය භාවිත නොකරන බවත් ඒ වෙනුවට එම ශිල්පීන් ලාක්ෂා වෙළෙඳ පොළෙන් මිල දී ගැනීමට යොමුව තිබෙන බවත් පෙනී ගියේය. තවද ලාක්ෂා කර්මාන්තයේ වර්ණ සකසා

ගැනීමේ දී අතීතයේ යොදාගත් සාම්ප්‍රදායික ක්‍රමෝපායන් භාවිතයෙන් සකසා ගත් වර්ණ වෙනුවට විවිධ ඩයි වර්ග භාවිතයෙන් වර්ණ සකසා ගැනීම සිදුකරනු දැකගත හැකි විය. එමෙන් ම හපුවිද ග්‍රාමයේ ශිල්පීන් මෙම වර්ණ මිශ්‍ර කිරීම සම්බන්ධයෙන් අත්පොතක් වශයෙන් එච්. ඇම්. සෝමරත්න හා කේ. එච්. අබේවර්ධනයන් ලාක්ෂා කර්මාන්තය පිළිබඳව රචනා කර ඇති කෘතිය භාවිත කරන අයුරු දක්නට ලැබුණි. එමඟින් වර්ණ මිශ්‍ර කර ගැනීම සම්බන්ධයෙන් පාරම්පරික දැනුම මෙම ශිල්පීන්ට ද ලැබී නොමැති තත්ත්වයක් මෙම පර්යේෂණයේ දී හඳුනාගත හැකි විය. නියපොතු වැඩ තාක්ෂණය සිදුකිරීම සම්බන්ධයෙන් හපුවිද ග්‍රාමය ප්‍රචලිත ය. නමුත් එම තාක්ෂණික ක්‍රමය ද මෙම ප්‍රදේශයෙන් වියැකෙමින් අද වන විට පට්ටල් ක්‍රමය භාවිතයට බොහෝ ශිල්පීන් යොමුව තිබෙනු දැකගත හැකිවිය. නූතන පරම්පරාව මෙම දැනුම ලබා ගැනීමට අකමැති වීම, සිය නිෂ්පාදනවලට සාධාරණ මිලක් නොලැබීම හේතුවෙන් ඇතැම් ශිල්පීන් කර්මාන්තය සිදුකිරීම අත්හැරීම, නිමි භාණ්ඩවලට ශක්තිමත් වෙළෙඳ පොළක් නොමැති වීම යනාදී හේතූන් නිසා මෙම ශිල්පයේ අනාගත සුරක්ෂිත භාවයට තර්ජනයන් එල්ලවී තිබේ.

සාකච්ඡාව

ලංකාවේ සාම්ප්‍රදායික කලා ශිල්ප අතර ලක්ෂා කර්මාන්තය විශේෂී වේ. ලංකාවේ පමණක් නොව ඉන්දියාව, ජපානය, බුරුමය, තායිලන්තය ආදී පෙරදිග රටවල ද පුරාණ කාලයේ සිට ම මෙම ශිල්පය පවත්වා ගෙන එනු ලැබ තිබේ. දෙවන පැතිස් රජ දවස දඹඅට කුල ශ්‍රේණීන්ගේ ආගමනයත් සමග පැවැත එන්නේ යැයි පිළිගැනෙන මෙම කර්මාන්තය ලංකාව තුළ ව්‍යාප්ත වූ බව ඓතිහාසික පතපොතෙහි සඳහන් වේ. අමාවතුර, කව්සිළුමිණ, සද්ධර්මරත්නාවලිය ආදී පැරණි සාහිත්‍ය මූලාශ්‍රයවල ලාක්ෂා පිළිබඳව සඳහන්ව තිබේ. මෙරට මධ්‍යකාලීන යුගය ලාක්ෂා කර්මාන්තයේ වර්ධනාත්මක යුගය වශයෙන් හඳුනාගත හැකිය.

මෙරට තුළ අද වන විට ලාක්ෂා කර්මාන්තය ප්‍රචලිතව පවතින්නේ ස්ථාන කිහිපයක පමණි. ඒ මාතලේ හපුවිද, මහනුවර හුරිකඩුව සහ මාතර අගුල්මඩුව යන ග්‍රාමයන්වල ය. මේ අතුරින් මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේ හපුවිද ග්‍රමය ලාක්ෂා කර්මාන්තයේ සාම්ප්‍රදායික තාක්ෂණික ක්‍රමවේදයක් වන "නියපොතු වැඩ" ක්‍රමයෙන් ලාක්ෂා කර්මාන්තය සිදුකරන ප්‍රදේශයක් වශයෙන් වඩාත් ප්‍රචලිතය. පට්ටල් ක්‍රමයෙන් මෙම කර්මාන්තය සිදුකරන ප්‍රදේශයක් වශයෙන් මාතර අගුල්මඩුව ප්‍රචලිතය. අද වන විට මහනුවර හුරිකඩුව ප්‍රදේශයෙන් මෙම කර්මාන්තය අභාවයට ගොස් තිබේ.

මෙම අධ්‍යයනය සිදුකිරිමේ දී පල්ලේ හපුවිද ග්‍රාමයේ මේ වන විටත් ලාක්ෂා කර්මාන්තයේ නිරතව සිටින උපාලි අබේසේකර, ජයලත් සේනාරත්න මහතා සහ විජේරත්න යන පාරම්පරික ශිල්පීන් තිදෙනා සමග සම්මුඛ සාකච්ඡා පවත්වමින් සහ ක්ෂේත්‍ර නිරීක්ෂණයන් මඟින් තොරතුරු ලබා ගැනීම සිදු කළේය. මාතලේ නගරයේ සිට කි.මී. 12ක් පමණ ගොස් ලැලිඅඹේ හන්දියෙන් උතුරු දෙසට ගමන් කිරීමෙන් මෙම ශිල්පීන්ගේ නිවෙස් කරා පැමිණිය හැකි ය. ඔවුන් සමඟ සිදුකළ සාකච්ඡාවල දී නූතන යුගය වන විට පාරම්පරික ක්‍රම භාවිතය අවම බවට දැනගැනීමට ලැබුණි. අතීතයේ දී මෙන් ලාක්ෂා කෘමියා ගෙන් ලාකඩ සපයා ගැනීම අද වන විට සිදුනොවේ. වර්තමානයේ දී ලාක්ෂා වෙළෙඳපොළෙන් මිල දී ගැනීම සිදුකරයි. වර්ණ පවා ඩයි වර්ග භාවිතයෙන් සකසා ගැනීමට මෙම ශිල්පීහු පෙලඹී ඇත්තාහ. වර්ණ සම්මිශ්‍රණය කිරීම මෙම ශිල්පීන් සිදුකරන්නේ සාම්ප්‍රදායික දැනුම උපයෝගී

කර ගෙන නොවේ. ඔවුන් එහිදී එච්. ඇම්. සෝමරත්න හා කේ. එච්. අබේවර්ධනගේ කෘතිය අත්පොතක් වශයෙන් භාවිතයට ගැනීමට පෙලඹී තිබේ. ලාක්ෂා කෙඳි භාවිතයෙන් සිදුකරන නියපොතු වැඩ ක්‍රමය ශිල්පියාගේ ඉවසීම, පළපුරුද්ද, නිර්මාණ ශක්තිය ප්‍රකට කරවන්නකි. එහෙත් එම ක්‍රමයට ප්‍රචලිත ප්‍රදේශයක් වශයෙන් හපුවිද හැඳින්වුව ද අද වන විට පට්ටල් ක්‍රමය භාවිත කිරීමට මෙම ශිල්පීන් වැඩි වශයෙන් නැඹුරුව තිබෙන ආකාරයක් හඳුනාගත හැකිවිය.

සමාලෝචනය

මෙම ශිල්ප කර්මාන්තයේ නියැළෙන ශිල්පීන්ට හිමි වන සමාජ සැලකිල්ල, මෙම ශිල්ප කලාවේ සාම්ප්‍රදායික දැනුම ඉගෙන ගැනීමට වත්මන් පරපුර රුචියක් නොදැක්වීම, නවීන ශිල්ප ක්‍රම හා උපකරණ භාවිතයට ගැනීම ආදිය මෙම කර්මාන්තයේ වර්තමාන අභියෝග වී තිබේ. තවද සාධාරණ මිලක් හිමි නොවීම, ශක්තිමත් වෙළෙඳපොළක් නොවීම ආදිය ද මෙහි අනාගත පැවැත්මට අහිතකර ලෙස බලපා තිබේ. මෙවැනි දුෂ්කරතා සහ අභියෝග හමුවේ සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තය වර්තමානය වන විට සමාජයෙන් වියැකෙමින් යන තත්ත්වයට පත්වී ඇති බවට නිගමනය කළ හැකිය. එම නිසා මෙම ගැටලුවලට විසඳුම් ලබා දෙමින් සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තකරුවන් දිරිමත් කරමින් ඔවුන්ගේ දැනුම බෙදාහදා ගැනීමට අවස්ථා සලසා දී සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තයේ සුරක්ෂිත බව ඇති කිරීමට රාජ්‍ය මට්ටමින් වැඩි අවධානයක් සහ මැදිහත් වීමක් අත්‍යවශ්‍ය වන්නේ ය. විශේෂයෙන් ම සංචාරකයන් අළලා ලාක්ෂා නිමි භාණ්ඩ අලෙවි කිරීම හා එහි ලාභය අතරමැදියන් සතු නොවී මෙම ශිල්පීන් සතුවීමට විධිමත් ක්‍රමවේදයක් සකසා දීමට රජයේ මැදිහත් වීම අත්‍යවශ්‍ය වන්නේ ය. විශ්වවිද්‍යාලයන්හි පුරාවිද්‍යාව විශේෂ උපාධිය හදාරන විද්‍යාර්ථීයින්ට මෙවැනි සාම්ප්‍රදායික ශිල්ප කර්මාන්තයන් පිළිබඳව පුළුල් වශයෙන් අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දීම මගින් සාම්ප්‍රදායික ශිල්පයන්ගේ අනාගත පැවැත්ම යම් පමණකට හෝ සුරක්ෂිත විය හැකිය. එමගින් සාම්ප්‍රදායික දැනුම තුරන් නොවී අප අතර තවත් කාලයක් පවත්වා ගත හැකි වනු ඇත.

ආශ්‍රිත ග්‍රන්ථ

ඇල්ලේපොළ, දීපාංජලී. *ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ශිල්ප කුල හා එම ශිල්ප කර්මාන්ත පිළිබඳ විමර්ශණයක්.*(2009)ප්‍රණාමාඤ්ජලී.(සංස්). විල්ලේගොඩ සිරිවිමල හිමි. නුගේගොඩ: බ්‍රිලියට් ජේ ප්‍රින්ටින්.

කුමාරස්වාමි, ආනන්ද කේ. (2004)*මධ්‍ය කාලීන සිංහල කලා.*(පරි). එච්.ඇම්.සෝමරත්න. කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

මහාවංසය,(2003)(සංස්). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නුගේගොඩ: අජිත් මුද්‍රණ.